# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර - සහකාර වතු අධිකාරී

**සුදුසුකම්** - (අ) බාහිර අපේක්ෂකයන් (පහත 1, 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කෘෂිකර්ම / වැවිලි කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය

   **හා**

   ප්‍රාදේශීය වැවිලි සමාගමක, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ, හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ (ජනවසම) අභ්‍යාසලාභී වැවිලිකරුවෙකු (Creeper) ලෙස මාස 9 ක පුහුණුවක් ලබා තිබීම.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් / වැවිලි කළනාකරණය පිළිබඳ ජාතික ආයතනය විසින් නිකුත් කරන ලද තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   **සමග**

   සංස්ථාවක, මණ්ඩලයක, ප්‍රාදේශීය වැවිලි සමාගමක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

   **සහ**

   ප්‍රාදේශීය වැවිලි සමාගමක, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ (ජනවසම) අභ්‍යාසලාභී වැවිලිකරුවෙකු (Creeper) ලෙස මාස 9 ක පුහුණුවක් ලබා තිබීම.

03. රජයේ / අර්ධ රජයේ ආයතනයක හෝ පිළිගත් ප්‍රාදේශීය වැවිලි සමාගමක සහකාර වතු අධිකාරිවරයෙකු ලෙස වසර තුනට (03) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය යටතේ පහසුකම්

තෝරාගනු ලබන අපේක්ෂකයන් සේවක අර්ථ සාධක අරමුදල හෝ ලංකා වැවිලි කරුවන්ගේ අර්ථ සාධක සංගමයට තම වැටුපෙන් 10% ක දායකත්වයක් ලබා දිය යුතු අතර, අර්ථ සාධක අරමුදල සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දායකත්වය වැටුපෙන් 12% ක් වන අතර, සේවක භාරකාර අරමුදල සඳහා වන දායකත්වය 3% ක් වේ.

යතුරු පැදියක් හෝ දීමනාවක් හා ඉන්ධන කෝටාවක් ලබා දෙනු ලැබේ.

බාහිර කම්කරුවෙකු හා අභ්‍යන්තර කම්කරුවෙකු සඳහා කම්කරු දීමනා සමග ගෘහ භාණ්ඩ සහිත බංගලාවක් ලබා දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි JM 1 -1-2016 රු. (42,600-10X755-18X1,135-70,580) ක වැටුප් පරිමාණයක් ඉහත තනතුර සඳහා හිමිවේ.

**වයස** - අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය.

**බඳවාගැනීමේ පරිපාටිය** - පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මඩුල්ලක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** -

| | | |
|---|---|---|
| ● අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| ● අදාළ අතිරේක සුදුසුකම් | - | ලකුණු 30 |
| ● අනෙකුත් කාර්ය සාධනයන් | - | ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්ය සාධනය | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

**අනෙකුත් දෑ** - මෙම කාණ්ඩ සඳහා වන සියලුම බඳවාගැනීම්, බඳවා ගැනීමේ යෝජනාක්‍රමයේ විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලැබේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර සහිත ස්වකීය අයදුම්පත්, උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග, කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

2023.02.17 වෙනි දින පළ කරන ලද දැන්වීමට අනුව ඉහත තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නැත. ඔවුන්ගෙන්, මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** - 2023 අප්‍රේල් 25 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරි ධම්ම මාවත, කොළඹ 10.**
**2023.04.03**